SC

# දේශීය ඥානය රැස් කිරීම, සංරක්ෂණය හා ප්‍රචාරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙන් ඉටුවන මෙහෙය

ලියන ගුණරත්නගේ චන්දිමා නිශාන්ති වාදසිංහ

(FGS/L/MSSc/2005/11)

| ප්‍රවේශ අංකය | 596 |
| --- | --- |
| වර්ග අංකය | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී

2008 ඔක්තෝබර්

## සාරාංශය

විවිධ රටවල වෙසෙන ආදිතම ජන කණ්ඩායම් අදාළ රට තුළ හෝ භූගෝලීය ප්‍රදේශයන්හි, දේශීය ජනතාවගෙන් පැවත එන ජන කොටසක් වන අතර ඔවුන් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික සාධක අනුව විවිධත්වයකින් යුක්ත වේ. දේශීය ජන කොට්ඨාශයක් දරණ පාරම්පරික දැනුම මෙම විවිධත්වයේ පදනම වේ.

පාරම්පරික දැනුම නැතහොත්, දේශීය දැනුම වනාහි සෑම මිනිස් සමාජයකටම ආවේනික  වූ ඒ ඒ ජාතියට අයත් සංස්කෘතික උරුමයකි. මෙම දායාදය ජන ව්‍යවහාරයෙන්ම ලැබූ අත්දැකීමක් වන අතර ඇසීමෙන් එක්රැස් කරගත් දැනුම හා භාවිතයෙන්ම අඩුවැඩි වී ඔපලත් සම්ප්‍රදායක් වේ.  ලිඛිත යුගයකට පෙර සිටම ග්‍රාමීය ජීවිතයට අවශ්‍ය පරිදි සැකසී ඇති මෙම දැනුම් පද්ධතිය තුළ ගාම්භීර දර්ශන හා චින්තන නොමැත. ගමේ පොදු ජනයා අතර ගොඩනැගුණු මෙම දැනුම් පද්ධතිය බලයෙන් හෝ නීතියෙන් සමාජ සම්මත කළ නොහැකි අතර ජන සම්මුතිය මත එහි බලය රැඳී ඇත. ආදි යුගයේ සිටම රටක දේශීය දැනුම් සම්පත් වලට නව අත්දැකීම් එකතු කරමින් සාරවත් දේශීය දැනුම් සම්පත් ගොඩනැගීම එහි හිමිකරුවන්ගේ වගකීම විය. ජීවමාන සම්ප්‍රදායට නොව හමාර වුණු සම්ප්‍රදායට අයත් මෙම දැනුම ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මානවයාගේ බුද්ධිමය හා චින්තනමය හැකියාව පෙන්වන ලද කැඩපතක් ලෙස සැළකිය හැකිය.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

නවීන විද්‍යාත්මක මෙවලම් නොමැති සහ සාක්ෂරතාව නොමැති වකවානුවක තමන්ගේ පරම්පරාවන්ට උරුම වූ තාක්ෂණික දැනුම, පරපුරේ උරුමයක් ලෙසින් රැකගෙන තිබීම විශේෂත්වයකි. පරම්පරා දැනුමෙන් පෝෂණය වූ ආදිවාසීන්, ඒ තුළින්ම ඔවුන්ගේ සහජ බුද්ධිය ලොවට උරුම කර දී ඇත. එදා ඉදි කළ මහා වැව් අද අභිමානවත්ව රට පෝෂණය කරනුයේ ඒවායේ ඉදි කිරීම් සඳහා යොදාගත් ඒ අද්විතීය දැනුම් හා බුද්ධි මහිමය හේතුවෙනි. පෙර කලාකරුවෝ සිය නිර්මාණ අනාගත ලෝකයට ඉතිරි කර ගියේ ද පෙර කී දැනුම හා අවබෝධය සිය නිර්මාණයන් පොහොසත් කළ නිසාවෙනි. කෘෂිකර්මය, වාරිමාර්ග, ජනශ්‍රැතිය, ඖෂධ හා ප්‍රතිකාර ක්‍රම, ආහාර සංරක්ෂණ ක්‍රම, කලාව ආදී ක්ෂේත්‍ර තුළ පරම්පරාවෙන් පරම්පරාවට රැකගෙන ආ දැනුම් සම්භාරයන් වර්තමානයේ දී ද දැකගත හැකිය.

අනාදිමත් කාලයක සිට පැවත එමින් අප සංස්කෘතිය තුළ ගැබ් වූ එසේම සමාජ සාරධර්මයන්ගේ අභිවෘද්ධියට පාදක වෙමින් ජාතිය පෝෂණය කළා වූ මෙම දැනුම, බටහිර ආක්‍රමණිකයින්ගේ ග්‍රහණයත් සමඟ පිරිහීමේ මග සනිටුහන් විය. මෙමගින් සමාජය තුළ සිදු වූ ආර්ථික, තාක්ෂණික හා විද්‍යාත්මක විපර්යාසයන් සමඟ, පාරම්පරික දැනුම ද විපර්යාසයන්ට ලක් වූ අතර එමගින් එහි පිරිහීමේ අවධානම ද පැන නැගුණි. එහෙයින් පරම්පරාවෙන් පරම්පරාවට මෙම දැනුම ඒ ආකාරයෙන්ම සන්නිවේදනය නොවූ අතර එහි ඇතැම් කොටස්

සම්පූර්ණයෙන්ම වියැකී ගියේය. වර්තමානය වන විට පාරම්පරික වශයෙන් පැවත ආ දේශීය දැනුම විද්‍යාත්මක දැනුමෙන් යටපත් වීම හේතුවෙන් එහි සමාජීය හා සංස්කෘතිකමය අගය සමාජයෙන් ද තුරන් වී ගොස් ඇත.

දේශීය දැනුම් පද්ධතීන් තුල මානව වර්ගයාට වැදගත්වන අති විශාල දැනුම් සම්භාරයක් අන්තර්ගතව තිබුණ ද පරපුරෙන් පරපුරට මෙම දැනුමේ අන්තර්ගත කොටස් වියැකෙමින් පවතී. මෙම දැනුම පිළිබඳව පර්යේෂණ කිරීමට තව වසර පනහකින් හෝ සියයකින් පමණ විද්වතුන් බිහිවිය හැකි නමුත් පුද්ගලයන් පර්යේෂණ කිරීමට පෙළඹෙන විට මෙම දැනුම සම්පූර්ණයෙන්ම අභාවයට ගොස් තිබිය හැකිය. එහෙයින් මෙම දැනුම එක්රැස් කර සංරක්ෂණය කළ යුතුව ඇත. දේශීය දැනුම එක්රැස් කිරීම යනු මනුෂ්‍ය නිෂ්පාදනය එක්රැස් කිරීමකි. මෙම දැනුම සංරක්ෂණය කිරීමේදී මුද්‍රිත, ලිඛිත සහ වාචික දැනුම සංරක්ෂණය කළ යුතුව ඇත. බොහෝ විට පුස්තකාල / තොරතුරු මධ්‍යස්ථාන මුද්‍රිත දැනුම එක්රැස් කර සංරක්ෂණය කිරීමට උත්සාහ ගනු ලැබුවත් වාචික දැනුම එක්රැස් කර සංරක්ෂණය කිරීමක් සිදුවන්නේ නැත. එහෙයින් බොහෝ වාචික දැනුම් සම්භාරයන් විශාල කොටසක් දැනටමත් ශේෂ වී ඇති හෙයින් දැනට ඉතිරි වී තිබෙන වාචික සම්ප්‍රදායන් හෝ කඩිනමින් එක්රැස් කොට වාර්තාගත කර සංරක්ෂණය කළ යුතුව ඇත. දැනට වාර්තාගත වී තිබෙන දැනුමත් (පුස්කොළ පොත්, අත්ලිපි වැනි) නොසළකා හැරීම හේතුවෙන් තව වසර කිහිපයකින් විනාශ වී යා හැකිය. මේ නිසා ලේඛනගත වී තිබෙන මෙම දැනුම් සම්භාරයන් අනාගත ප්‍රයෝජනය සඳහා ග්‍රන්ථ නාමාවලි සැකසීම, පිටපත් සකස් කිරීම හා සංරක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුව ඇත. කෞතුකාගාර පුස්තකාලය, ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව හා ජාතික පුස්තකාලය වැනි ශාස්ත්‍රීය ආයතන වලට මෙම දුෂ්කර කාර්‍ය කිරීමේ හැකියාව පැවතියත් මේ සඳහා සුළු වශයෙන් හෝ දායකත්වයක් ලබා දී තිබෙන්නේ ජාතික පුස්තකාලය පමණි. ශ්‍රී ලාංකීය දේශීය දැනුම එක්රැස් කිරීම වෙනුවෙන් ජාතික පුස්තකාලය සතු ජනශ්‍රැති එකතුව ජාතියට මහඟු සේවයක් ඉටු කර ඇත.

*****